කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

# කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

## දෙවන වාර පරීක්ෂණය 2019, මාර්තු — 13 ශ්‍රේණිය

**ගිණුම්කරණය I** | 33 | S | I | **පැය දෙකයි**

**නම :-** ...........................................................................

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

- ♦ අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ♦ අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ♦ සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.

01. පහත දැක්වෙන කුමන ප්‍රකාශනය මූල්‍ය ගිණුම්කරණය වැදගත්කම වඩාත් හොඳින් විස්තර කරන්නේ ද?
1. තීරණ ගැනීමට කළමනාකරුවන්ට අවශ්‍ය මූල්‍ය තොරතුරු සැපයීමයි.
2. ව්‍යාපාරයේ වත්කම භාවිතා කිරීමට කළමණාකරුවන්ට තොරතුරු සැපයීම.
3. ව්‍යාපාරයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන්ට සහ එහි කළමනාකරුවන්ට තීරණ ගැනීම සඳහා සිදු වූ ගනුදෙනු හා සිද්ධීන් පාදය වූ ආර්ථික තොරතුරු සපයයි.
4. ව්‍යාපාරයක ඉපැයීම් ශක්තිය හා මූල්‍ය තත්වය පිළිබඳ ව්‍යාපාර අභ්‍යන්තර පාර්ශ්ව පමණක් දැනුවත් කිරීම.
5. ගිණුම්කරණ ඒකකයට අදාළ තොරතුරු ඇල්මැති පාර්ශවයන්ට සැපයීමයි.

(...........)

02. පහත දැක්වෙන කුමන ගනුදෙනුව ව්‍යාපාරයක ආපසු යැවුම් ජර්නලයේ සටහන් කරයි ද?
1. විකිණීමේ පරමාර්ථයෙන් සිදු කරන ලද සියලු විකිණීම් ආපසු එවුම්
2. ණයට විකුණන ලද සියලු වත්කම් ආපසු එවුම්
3. නැවත විකිණීමේ පරමාර්ථයෙන් මිලටගත් හෝ නිෂ්පාදනය කල භාණ්ඩ ණයට විකුණුම් ආපසු එවුම්
4. නැවත විකිණීමේ පරමාර්ථයෙන් ණයට ගත් භාණ්ඩ තොග හරවා යැවුම්
5. ණයට මිලදී ගත් ජංගම නොවන වත්කම් ආපසු යැවුම්

(...........)

03. 2018. 03. 01 වජිරා තම ව්‍යාපාරයේ කටයුතු සඳහා ඔහු සතු 500 000 ත්‍රීරෝද රථය යොදවන ලදී. එදිනම රු. 30 000 ක බඩු ණයට විකුණු අතර රු. 20 000 ක බඩු ඇණවුමට අනුකූලනොවූ නිසා හරවා යවා ඇත. මෙම ගනුදෙණු සටහන් කිරීම සඳහා භාවිතා කරනු ලබන මූලාශ්‍ර ලියවිලි අනුපිළිවෙලින්,
1. ලදුපත, ජ'නල් වවුචර් , ගැනුම් ඉන්වොයිසිය.
2. ජනල් වවුචර් , ලදුපත , විකුණුම් ඉන්වොයිසිය.
3. බැරපත , ලදුපත් , ජනල් වවුචරය
4. ජනල් වවුචරය , විකුණුම් ඉන්වොයිසිය , හරපත
5. විකුණුම් ඉන්වොයිසිය, බැරපත, ලදුපත

(...........)

04. සමීර විසින් තම පෞද්ගලික මුදලින් රු. 60 000 ක් ගෙවා ව්‍යාපාරයක් බැංකු අයිරාව පියවා දමන ලදී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්වන්නේ,
1. රු. 60 000 කින් වත්කම් වැඩිවීම සහ 60 000 කින් වගකීම් වැඩිවීම ලෙසය.
2. රු. 60 000 කින් හිමිකම් වැඩිවීම සහ 60 000 කින් වත්කම් වැඩිවීම ලෙසය.
3. රු. 60 000 කින් හිමිකම වැඩිවීම සහ 60 000 කින් වගකීම් අඩුවීම.
4. රු. 60 000 කින් හිමිකම වැඩිවීම සහ 60 000 කින් ආදායම් අඩු වීම.
5. රු. 60 000 කින් වත්කම් අඩුවීම සහ 60 000 කින් හිමිකම් අඩු වීම.

(...........)

05. ව්‍යාපාරයක මාසික සුළු මුදල් අග්‍රිමය රු. 5000 කි. 2019 ජනවාරි මාසය තුළ දී සිදු කරන ලද සුළු වියදම් ගෙවීම්වල එකතුව පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| ලිපි ද්‍රව්‍ය වියදම් | 1120 |
| ගමන් වියදම් | 540 |
| සංග්‍රහ වියදම් | 800 |
| තැපැල් වියදම් | 1450 |
| විවිධ වියදම් | 900 |

2019/ 01/31 දිනට සුළු මුදල් ගිණුමේ ඉදිරියට ගෙන ගිය ශේෂය වන්නේ,

1. රු. 990 කි
2. රු. 1190 කි
3. රු. 190 කි
4. රු. 2990 කි
5. රු. 4810 කි

(...........)

06. සමාගමක ණයගැති පාලන ගිණුමේ ශේෂය ණයගැති ලෙජර් ශේෂ එකතුවට වැඩිවිය මෙයට බලපෑ හේතුව වන්නේ,

1. ණයගැතියන්ට දුන් වට්ටම් ණයගැති පලන ගිණුමේ සටහන් නොවීම.
2. විකුණුම් හරවා එවුම් ණයගැති පාලන ගිණුමේ දෙවරක් සටහන් වීම.
3. විකුණුම් ඉන්වොයිසියක් ණයගැති ලෙජරයේ දෙවරක් සටහන් වීම.
4. වෙළඳ ලැබිය යුතු දෑ මත අපේක්ෂිත අලාභ සඳහා ඉඩ හැරීම ණයගැති ලෙජරයේ සටහන් නොවීම.
5. ණයට විකුණුම් පොතේ එකතුව අඩුවෙන් ණයගැති පාලන ගිණුමේ සටහන් වීම.

(...........)

07. ව්‍යාපාරයක දේපල පිරියත හා උපකරණ පාරිභෝජනය කිරීමෙන් සිදුවන භෞතික වැහැරීම වෙනුවෙන් අදාල කාලපරිච්ඡේදය සඳහා යම් ප්‍රතිපාදනයක් කළ යුතුයි. යන ප්‍රකාශනය වලංගුවන ගිණුම්කරණ සංකල්ප වන්නේ,

A - කාලච්ඡේද සංකල්පය
B - ගැලපුම් සංකල්පය
C - යථාරූපී සංකල්පය

1. A පමණි.
2. A හා B පමණි.
3. C පමණි.
4. B පමණි.
5. A හා C පමණි.

(...........)

08. ව්‍යාපාරයක අයිතිකරු තම පෞද්ගලික කටයුතු සඳහා මෙන්ම ව්‍යාපාරයේ කටයුතු සඳහා ද ව්‍යාපාරයේ බැංකු ගිණුම භාවිතා කරයි. ඔහු කඩකර ඇති ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1. ගැලපුම් සංකල්පය
2. උපලබ්ධි සංකල්පය
3. මුල්‍ය මිණුම් සංකල්පය
4. ආරක්ෂක සංකල්පය
5. ඒකක සංකල්පය

(...........)

09. 2018. 10. 31 දිනට ආසිරි සමාගමේ පහත තොරතුරු ඔබට ලබා දී ඇත.

- 2018. 10. 01 ඉදිරිපත් නොවූ චෙක් රු. 800 000
- 2018 ඔක්තෝම්බර් මාසයේ බැංකු ප්‍රකාශයේ මුළු හර කිරීම් රු. 4 000 000
- 2018 ඔක්තෝම්බර් මස මුළු හර කිරීම් තුල රු. 40 000 ක බැංකු ගාස්තු හා ස්ථාවර නියෝග රු 360 000 ක ගෙවීම් ඇතුලත් වේ.
- 2018 ඔක්තෝම්බර් මස මුදල් පොත අනුව නිකුත් කල චෙක්පත්වල වටිනාකම රු. 4800 000 ක් වේ.

2018. 10. 31 දිනට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම

1. රු. 1200 000
2. රු. 400 000
3. රු. 1 600 000
4. රු. 2 000 000
5. රු. 800 000

(...........)

10. රු. 200 000 ක් වූ භාණ්ඩ 10% ක වෙළඳ වට්ටමකට යටත්ව 15% VAT අනුපාතයකට ණයට විකිණීය. මෙම ගනුදෙණුව ගිණුම්ගත කරන නිවැරදි ආකාරය

| | හර | බැර |
|---|---|---|
| 1. | ණයගැති පාලන ගිණුම රු. 207 000 | විකුණුම් බැර 207 000 |
| 2. | ණයගැති පාලන ගිණුම රු. 180 000 | විකුණුම් ගිණුම 180 000 |
| 3. | ණයගැති පාලන ගිණුම රු. 200 000 | විකුණුම් ගිණුම 170 000<br>VAT 30 000 |
| 4. | ණයගැති පාලන ගිණුම රු 200 000 | විකුණුම් 200 000 |
| 5. | ණයගැති පාලන ගිණුම් රු 207 000 | විකුණුම් 180 000<br>VAT 27 000 |

(...........)

11. 2018. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයට අනුව දළ ලාභය හා ශුද්ධ ලාභය අනුපිළිවෙලින් රු. 420 000 ක් හා රු. 130 000 ක් විය. 2017. 04. 01 දිනට තොගය රු. 5 000 කින් අවතක්සේරු වී ඇති බවත් පසුව සොයා ගන්නා ලදී. තවද අයිතිකරු පෞද්ගලිකව ගෙවන ලද විදුලි බිල රු. 30 000 සටහන් වී නොමැත.
2018. 03. 31 න් අවසන් වර්ෂය සඳහා නිවැරදි දළ ලාභය හා ශුද්ධ ලාභය

| | දළ ලාභය (රු) | ශුද්ධ ලාභය (රු) |
|---|---|---|
| 1. | 415 000 | 100 000 |
| 2. | 385 000 | 100 000 |
| 3. | 415 000 | 95 000 |
| 4. | 425 000 | 105 000 |
| 5. | 415 000 | 125 000 |

(...........)

12. ශක්ති ක්‍රීඩා සමාජය සාමාජිකයන් 100 කින් සැදුම්ලත් ක්‍රීඩා සමාජයකි. එක් එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 1 000 කි. 2018. 03. 31 දිනෙන් අවසන් වසර තුල දී සාමාජිකයන්ගෙන් රු 105 000 ක මුදලක් ලැබුණි. මෙම මුදල තුල සාමාජිකයන් 4 දෙනෙකුගේ පසුගිය වසරට අදාල සාමාජික මුදල් ද ඊලග වසර සඳහා ලද සාමාජිකයන් 3 දෙනෙකුගේ සාමාජික මුදලක් ද ඇතුලත් විය. 2017. 04. 01 දිනට කලින් ලද සාමාජික මුදලක් නොතිබුණි

2018. 03. 31 දිනෙත් අවසන් වරට අදාල සාමාජික මුදල් ආදායම සහ 2018. 03. 31 දිනට ලැබිය යුතු සාමාජික මුදල වන්නේ,

| | සාමාජික මුදල් ආදායම (රු.) | ලැබිය යුතු සාමාජික මුදල (රු) |
|---|---|---|
| 1. | 105 000 | 2 000 |
| 2. | 97 000 | 4 000 |
| 3. | 100 000 | 2 000 |
| 4. | 105 000 | 3 000 |
| 5. | 96 000 | 3 000 |

(...........)

13. තාරුකගේ ව්‍යාපාරයේ 2018. 03. 31 දිනෙන් අවසන් වසර සඳහා ශුද්ධ ලාභය රු. 90 000 ක් විය. ශේෂ පිරික්සුමේ වෙනස අවිනිශ්චිත ගිණුමකට ලියා තබා එය මූල්‍ය තත්ව ප්‍රකාශනයට ගෙන තිබිනි. මේ සම්බන්ධයෙන් පසුව කරන ලද විමර්ශනයක දී පහත සඳහන් කරුණු අනාවරණය විය.

i. රු. 28 000 ක් වූ රක්ෂණ වියදම ශේෂ පිරික්සුමට ගෙන තිබුනේ රු. 32 500 ක් ලෙසය.
ii. ණය ගැතියන්ගෙන් ලද රු. 43 000 ක චෙක්පත ණයගැති පාලන ගිණුමෙන් මගහැරී ඇත.
iii. 2018/ 2019 වසර සඳහා ගෙවූ රු. 25 000 ක කුලී මුදල් ගෙවල් කුලී වියදම් ගිණුමේ අඩංගු වේ.

ඉහත වැරදි නිවැරදි කල පසු නිවැරදි ශුද්ධ ලාභය කොපමණ ද? සංශෝධනයට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය කීය ද?

| | නිවැරදි ශුද්ධ ලාභය (රු) | සංශෝධනයට පෙර අවිනිශ්චිත ගිණුම (රු) |
|---|---|---|
| 1. | 115 000 | 47 500 හර |
| 2. | 119 500 | 38 500 හර |
| 3. | 119 500 | 42 500 බැර |
| 4. | 94 500 | 38 500 බැර |
| 5. | 115 000 | 47 500 බැර |

(...........)

14. සම සමව ලාභ බෙදා ගනිමින් අමල්, කමල්, විමල් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය අතර 2018. 03. 31 වර්ෂයේ අවසාන දින විමල් ව්‍යාපාරයෙන් ඉවත් විය. විමල් ඉවත් වන දිනට ඔහුගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. 320 000ක් ද ජංගම ගිණුමේ හර ශේෂය රු. 25 000 ක් ද පැවතුණි. විමල් ඉවත්වන දිනට පිරිවැය රු. 600 000 ක් වූ මෝටර් රථයක් රු. 240 000 කට රැගෙන යන ලද අතර මෙම මෝටර් රථය වෙනුවෙන් සමුච්චිත ක්ෂය වටිනාකම රු. 300 000 කි.

විමල් ඉවත්වන විට ඔහුට ගෙවිය යුතු මුදල කොපමණ ද?

1. රු. 80 000 2. රු. 105 000 3. රු. 55 000
4. රු. 35 000 5. රු. 45 000

(...........)

15. ගිණුම්කරණ සංකල්පනාත්මක රාමුවට අනුව හඳුනාගත හැකි වැඩි දියුණු කිරීමේ ගුණාත්මක ලක්ෂණ හතරකි. එයට අදාල නොවන ලක්ෂණය වන්නේ,

1. අවබෝධකරගත හැකි බව 2. පිරිවැය/ප්‍රතිලාභ අතර සමබරතාව
3. කාලානුරූප බව 4. සත්‍යාපනය කල හැකි බව
5. සන්සන්දයකළහැකි බව

(...........)

16. වෙළඳ ව්‍යාපාරයක 2018. 03. 31 දිනට ඉතිරි තොගයට අදාලව පහත තොරතුරු ලබාදේ,

| තොග අයිතමය | ඒකක පිරිවැය (රු.) | ඒකකයක අපේක්ෂිත ලාභය/ අලාභය (රු.) | ඉතිරි ඒකක ගණන |
|---|---|---|---|
| X | 20 | 10 | 1000 |
| Y | 30 | 0 | 2000 |
| Z | 50 | (5) | 1000 |

අයිතම් ක්‍රමය අනුව 2018. 03. 31 දිනට තොගය සහ 2018. 03. 31 දිනෙන් අවසන් වසරේ වෙළඳ ගිණුමේ ඇතුලත් කලයුතු තොගය,

| | අයිතම් ක්‍රමයට තොගය (රු.) | වෙළඳ ගිණුමේ ඇතුලත් කලයුතු |
|---|---|---|
| 1. | 95 000 | 130 000 |
| 2. | 130 000 | 125 000 |
| 3. | 75 000 | 75 000 |
| 4. | 125 000 | 130 000 |
| 5. | 125 000 | 125 000 |

(...........)

17. සීමිත සමාගමක ගිණුම් වර්ෂයක් අවසානයේ පැවති එක්තරා සිදුවීමක් සම්බන්ධව පහත සඳහන් ලක්ෂණ ද ඇත.

A - අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් ඇත.
B - එය නිරාකරණය කිරීමේ දී සම්පත් පිටතට ගලායාමක් සිදුවිය හැක.
C - බැඳීමේ ප්‍රමාණය සාධාරණ ලෙස ඇස්තමේන්තු කල හැක.

ඉහත ලක්ෂණ අනුව මෙය,

1. ප්‍රතිපාදනයක් ලෙස 2. සම්මුතික බැඳීමක් ලෙස
3. ඇස්තමේන්තුවක් ලෙස 4. වගකීමක් ලෙස
5. අසම්භාව බැරකමක් ලෙස

හඳුනාගත යුතුය.

(...........)

18. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 (LKAS - 08) ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු හා වැරදි ප්‍රමිතියට අනුව පහත කරුණු ඔබට දී ඇත.

A - කළමණාකරණ තීරණ මත
B - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියක් මගින් ඉල්ලා ඇතිවිට
C - ව්‍යාපාරයේ හිමිකරුගේ අභිමතය පරිදි
D - ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය හා මුදල් ප්‍රවාහය පිළිබඳ විශ්වාසනීය හා වඩාත් අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් ලබා දීම.

LKAS - 08 අනුව ඉහත තොරතුරුවලින් ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කල හැකි අවස්ථාව වන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | A පමණි | 2. | B හා C පමණි | 3. | A හා C පමණි |
| 4. | A හා D පමණි | 5. | B හා D පමණි | | |

(..........)

19. සීමිත අරලිය පොදු සමාගමේ 2018. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂකවරුන් අනුමත කරන ලද්දේ 2018. 06. 15 දිනය මූල්‍ය ප්‍රකාශන පිලියෙල කල දිනයක් මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඇති දිනයත් අතර පහත සිදුවීම් සිදු වී ඇත.

A - 2018. 03. 31 දිනට පිරිවැය රු. 850 000 ක් වූ තොගයක් රු. 800 000 ට 2018. 5. 14 දින විකුණා ඇත.

B - 2018. 06. 10 දින සාමාන්‍ය කොටස් හිමියන්ට රු. 100 000 අවසාන ලාභාංශයක් ප්‍රකාශ කිරීම.

C - 2019. 06. 30 දිනට රු. 50 000 වගකීමක් තහවුරු කරමින් 2018. 05. 16 නඩු තීන්දුවක් ලබාදීම.

D - 2018. 03. 31 දිනට රු. 50 000 ක් ගෙවිය යුතු ණයගැතියෙකු 2018. 05. 04 දින බුන්වත් බව ප්‍රකාශ කිරීම.

ඉහත සිදුවීම අතරින් LKAS 10 වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම් ප්‍රමිතය අනුව මූල්‍ය ප්‍රකාශනවල ගලපන සිදුවීම් වන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | A හා B පමණි | 2. | A, C හා D පමණි | 3. | A හා D පමණි |
| 4. | A, B හා C පමණි | 5. | B හා D පමණි | | |

(..........

20. පහත තොරතුරු 2018 ජනවාරි මාසය සඳහා සමාගමක භාණ්ඩයකට අදාල වේ.

- 2019. 01. 01 දින ඒකකයක පිරිවැය රු. 50 බැගින් වූ ඒකක 2000 ක් ගබඩාව තුල තිබුණි.
- 2019. 01. 10 දින ඒකකයක් රු. 60 බැගින් වූ ඒකක 4000 ක් ණයට මිල දී ගත්තා
- 2019. 01. 15 දින ඒකකයක් රු. 100 බැගින් තොග ඒකක 3 000 ක් අත්පිට මුදලට වික්කා
- 2019. 01. 10 දින මිල දී ගත් තොගවලින් ඒකක 500 ක් නියමිත තත්වයෙන් නොතිබුණ බැවින් 2019. 01. 18 දින ආපසු හරවා යැවුවා
- 2019. 01. 25 දින ඒකක 1 500 ක් ඒකකයක් රු. 110 බැගින් ණයට වික්කා
- තොග නිකුත් කිරීම, මිල කිරීම සඳහා සමාගම පෙර පිවිසි පෙර පිට (FIFO) ක්‍රමය භාවිතා කරයි.

2019. 01. 31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් පිරිවැය සහ 2019. 01. 31 දිනට තොගයේ වටිනාකම

| | විකුණුම් පිරිවැය (රු) | තොගය (රු) |
|---|---|---|
| 1. | 250 000 | 60 000 |
| 2. | 25 000 | 90 000 |
| 3. | 25 000 | 90 000 |
| 4. | 35 000 | 60 000 |
| 5. | 280 000 | 60 000 |

(..........)

21. LKAS - 16 ට අනුව යන්ත්‍රයක පිරිවැය තීරණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන්නේ පහත අයිතමයන්ගෙන් කුමන ඒවා ද

A - ඉංජිනේරු ශිල්පි ගාස්තු

B - යන්ත්‍ර මිලට ගැනීමට ගත් ණය සඳහා පොලී

C - යන්ත්‍රයේ පිරිවැය

D - යන්ත්‍රය ස්ථාපනය කිරීමේ පිරිවැය

1. ABC 2. AB 3. ABD 4. BD 5. ACD

(..........)

♦ ප්‍රශ්න අංක 22 හා 25 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සමාගමට පහත තොරතුරු භාවිත කරන්න.

| | 2018. 03. 31 දිනට රු. | 2017. 03. 31 දිනට රු. |
|---|---|---|
| මුළු වත්කම් | 3 000 000 | 2800 000 |
| ප්‍රකාශිත සා. කොටස් ප්‍රාග්ධනය | 1 000 000 | 900 000 |
| රඳවාගත් ඉපයුම් | 650 000 | 500 000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 50 000 | |

2018. 03. 31 න් අවසන් වර්ෂය සඳහා
සාමාන්‍ය කොටස්කරුවන්ට

| | |
|---|---|
| ගෙවූ අතුරු ලාභාංශ | රු. 150 000 |
| වසරේ ආදායම් බදු වියදම | 70 000 |
| හිමිකම් කොටස් නිකුතුව | ? |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලාභය | ? |

22. 2018. 03. 31 දිනෙන් අවසන් වසරේ මුළු විස්තීරණ ආදායම සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලාභය වනුයේ,

| | <u>මුළු විස්තීරණ ආදායම (රු)</u> | <u>ගොඩනැගිලි ප්‍රත්‍යා ගණන ලාභය (රු)</u> |
|---|---|---|
| 1. | 300 000 | 50 000 |
| 2. | 250 000 | 20 000 |
| 3. | 350 000 | 50 000 |
| 4. | 300 000 | 100 000 |
| 5. | 370 000 | 50 000 |

(...........)

23. 2018. 03. 31 දිනෙන් අවසන් වසරේ සමාගමේ හිමිකම කොපමණ ප්‍රමාණයකින් වෙනස් වී ද?
1. රු. 300 000 කින් අඩු විය
2. රු. 300 000 කින් වැඩි විය
3. රු. 50 000 කින් වැඩිවිය
4. රු. 10 000 කින් වැඩිවිය
5. රු. 150 000 කින් අඩු විය.

(...........)

24. පහත සඳහන් තොරතුරු 2018. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කපිල සමාගමේ පොත් වලින් උපටා ගෙන ඇත.

| | රු. මිලියන |
|---|---|
| බදු පෙර ශුද්ධ ලාභය | 12 |
| වාර්ෂික ක්ෂය වීම | 02 |
| ආදායම් බදු ගෙවීම | 03 |

| | රු. මිලියන 2018. 03. 31 | 2017. 03. 31 |
|---|---|---|
| තොගය | 8 | 4 |
| ණය ගැතියෝ | 4 | 3 |
| ණය හිමියෝ | 5 | 4 |
| උපචිත වියදම් | 2 | 3 |

මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?
1. රු. මිලියන 6 යි
2. රු. මිලියන 8 යි
3. රු. මිලියන 9 යි
4. රු. මිලියන 10 යි
5. රු. මිලියන 12 යි

(...........)

25. ගැණුම් අධියාචනා පත්‍රය යනු,
1. කම්හල් කළමනාකරු සකස් කොට ගබඩාව වෙත යැවෙන්නකි.
2. ගැනුම් දෙපාර්තමේන්තුව සකස් කොට විකුණුම් දෙපාර්තමේන්තුව වෙත යැවෙන්නකි.
3. ගැණුම් දෙපාර්තමේන්තුව සකස් කොට ගබඩාවට යැවෙන්නකි.
4. ගබඩාවෙන් සකස් කොට ගැනුම් දෙපාර්තමේන්තුවට යැවෙන්නෙකි.
5. කර්මාන්ත ශාලාව සකස්කොට සැපයුම්කරු වෙත යැවෙන්නකි.

(...........)

♦ ප්‍රශ්න අංක 26 සහ 27 සඳහා පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.
පහත තොරතුරු නිෂ්පාදන ආයතනයක ප්‍රධාන අමුද්‍රව්‍ය වලට අදාල වේ.

- වාර්ෂික ඉල්ලුම ඒකක 36 000
- තොග තබාගැනිමේ පිරිවැය ඒකකයට රු. 8
- එක් ඇණවුමක් සඳහා පිරිවැය රු. 10
- පරිභෝජනය (මසකට) ඒකක 200 - 400 දක්වාට වෙනස් වේ.
- මසකට සති 4 කි. පොරොත්තු කාලය සති 2 සිට 4 දක්වා වෙනස් වේ.

26. ඉහත ද්‍රව්‍යයෙහි අවම තොග වට්ටම සහ වසරක් තුල එම තොග ඇණවුම් කලයුතු වාර ගණන වන්නේ,

| | අවම තොග මට්ටම (ඒකක) | ඇණවුම් කල යුතු වාර ගණන |
|---|---|---|
| 1. | 175 | 120 |
| 2. | 700 | 120 |
| 3. | 700 | 60 |
| 4. | 600 | 60 |
| 5. | 600 | 100 |

(...........)

27. ආර්ථික ඇණවුම් ඒකක ප්‍රමාණය වනුයේ,
1. 576 2. 360 3. 900 4. 300 5. 600

(...........)

28. ව්‍යාපාරයකින් උපුටා ගන්නා ලද තොරතුරු පහත දක්වේ.

♦ ව්‍යාපාරයේ මුළු ප්‍රාග්ධනය රු. 1 000 000 ක් වූ අතර හිමිකම් අනුපාතය 80% කි.

♦ ව්‍යාපාරයේ මුළු විකුණුම් වටිනාකම රු. 400 000 ක් වන අතර ශුද්ධ ලාභ අනුපාතය 40% කි.

♦ සමාගමේ පොලී වියදම රු. 10 000 වූ අතර වර්ෂයේ ලාභාංශ රු. 40 000 කි.

සමාගමේ හිමිකම් ප්‍රතිලාභ අනුපාතය වන්නේ,
1. 15% 2. 20% 3. 25% 4. 30% 5. 28%

(...........)

29. සමාගමක ණයගැතියන් පිළිබඳ පහත තොරතුරු සපයා ඇත.

| | (රු. 000) |
|---|---|
| 2017. 04. 01 ශේෂය | 900 |
| 2018. 03. 31 ශේෂය | 1 100 |
| වර්ෂය තුල ලද මුදල් | 7 500 |
| ණයගැතියන්ට ලබා දුන් වට්ටම | 300 |

ණයගැති පිරිවැටුම් අනුපාතය වාර ගණන,
1. 7 . 2 2. 7. 5 3. 8. 5 4. 7. 77 5. 8

(...........)

30. අයිතමයක නිෂ්පාදන ප්‍රමාණය වැඩි වන විට පහත කුමන ප්‍රකාශනය නිවැරදි ද?
1. ඒකකයක විචල්‍ය පිරිවැය අඩුවේ.
2. ඒකකයක ස්ථාවර පිරිවැය අඩු වේ.
3. මුළු පිරිවැය අඩු වේ.
4. ඒකකයක ස්ථාවර පිරිවැය සහ ඒකකයක විචල්‍ය පිරිවැය වෙනස් නොවේ.
5. ඒකකයක විචල්‍ය පිරිවැය වෙනස් නොවී පවතින අතර ඒකකයක ස්ථාවර පිරිවැය වැඩි වේ.

(...........)

**ප්‍රශ්න අංක 31 - 50 සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

31. පහත සඳහන් ගනුදෙණු හා සිද්ධි අදාල වන ගිණුම්කරණ පරිසර සාධකය සඳහන් කරන්න.

| ගනුදෙණුව/ සිද්ධිය | | පරිසර සාධකය |
|---|---|---|
| i. | රුපියලෙහි අගය අව ප්‍රමාණය වීම වැළැක්වීමට වාහන ආනයනය සීමා කර ඇත. | ........................................ |
| ii. | රත්‍රන් වෙළඳාමේ දී සිදුවිය හැකි වංචා අවම කිරීමට ඩෙන්සි මීටරය භාවිත කිරීම. | ........................................ |
| iii. | බොහෝ ව්‍යාපාර ආයතන දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීම සඳහා සරල මාර්ග ක්ෂය ක්‍රමය යොදා ගනී. | ........................................ |
| iv. | හවුල් ව්‍යාපාරයක ලිඛිත ගිවිසුමක් නොමැති විට ලාභ/අලාභ සම සමව බෙදාගත යුතුය. | ........................................ |

**ප්‍රශ්න අංක 32 , 33 සඳහා පහත තොරතුරු භාවිතා කරන්න. සුමිහිරි රස කැවිලි නිෂ්පාදකයින් 2018 දෙසැම්බර් මාසයට අදාල තොරතුරු පහත දැක්වේ.**

i.

| | රු. 000 |
|---|---|
| අමුද්‍රව්‍ය ගැණුම් | 400 |
| සෘජු ශ්‍රමය | 300 |
| සෘජු වියදම් | 50 |
| නිශ්පාදන පොදු කාර්ය පිරිවැය | 400 |

ii.

| අයිතමය | 2018. 12. 31 | 2018. 12. 01 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| අමුද්‍රව්‍ය | 40 | 70 |
| නොනිමි ද්‍රව්‍ය | 160 | 140 |
| නිමි ද්‍රව්‍ය | 220 | 210 |

iii. 2018 දෙසැම්බර් මාසයෙහි විකුණුම් පිරිවැය මත 25% ලාභාන්තියක් සහිතව විකුණුම් සිදු කරයි.

32. 2018 දෙසැම්බර් මාසය සඳහා,

අ. ප්‍රාථමික පිරිවැය ...........................................

ආ. නිශ්පාදන පිරිවැය ...........................................

33 මෙම මාසය තුල දී ඉපයූ

අ. විකුණුම් ආදායම් ...........................................

ආ. දළ ලාභය/ දළ අලාභය ...........................................

34. විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සත්‍ය/ අසත්‍ය බව දක්වන්න.

A. එය ව්‍යාපාරයේ සැලසුම් පිළියෙල කිරීමට හා පාලනයට උපකාරී වේ. ...........................................

B. ඇල්මැති සියළු පාර්ශ්වයන් සඳහා පිළියෙල කරයි ...........................................

C. ආයතනයේ තොරතුරු පද්ධතියේ කොටසකි ...........................................

D. බාහිර පාර්ශවයන්ට තීරණ ගැනීමට උපකාරී වේ. ...........................................

35. සීමිත ජයමාලි පොදු සමාගමේ 2018. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශ උද්ධෘත පශත දක්වේ.

| | | රු. 000 |
|---|---|---|
| <u>ප්‍රකාශිත ප්‍රාග්ධනය</u> | | |
| සාමාන්‍ය කොටස් (10 000) | | 300 |
| <u>සංචිත</u> | | |
| පොදු සංචිත | 140 | |
| රඳවාගත් ඉපයුම් | 18 | 158 |
| මුළු හිමිකම | | 458 |

අතිරේක තොරතුරු :

1. 18. 10. 01 දිනට සිටින සාමාන්‍ය කොටස් 5 : 1 ක් වන සේ, කොටසක ප්‍රතිෂ්ඨාව රු. 40 බැගින් සංචිත ප්‍රාග්ධනිත කිරීමක් සිදු කරන ලදී.
2. 18. 10. 01 දින කොටසක් රු.20/= බැගින් කොටස් 5 000 ක හිමිකම් නිකුතුවක් සිදු කරන ලදී.

අ. සංචිත ප්‍රාග්ධනිත කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

ආ. ඉහත ගනුදෙණු වලින් පසු 2018. 10. 01 දිනට සමාගමේ මුළු හිමිකම වනුයේ,

.............................................................................................................................................

**ප්‍රශ්න අංක 36, 37 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරුභාවිතා කරන්න.**

රංග සහ තරංග 3 : 2 අනුපාතයට ලාභලාභ බෙදා ගනිමින් පවත්වා ගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2018. 03. 31 න් අවසන් වර්ෂයට අදාලව පහත තොරතුරු සපය ඇත.

- රංගට හා තරංගට පිළිවෙලින් රු. 100 000/= ක හා රු. 60 000/= වාර්ෂික වේතන හිමි වේ.
- 2018. 03 25 දින ඉදිරි ගිණුම් වර්ෂය සඳහා ලද අත්තිකාරම් මුදල් රු. 100 000/= තරංග සිය පෞද්ගලික ප්‍රයෝජනයට ගෙන ඇතත් මෙය වාර්තා කර නොමැත.
- රංග විසින් 2017. 04. 01 දින ව්‍යාපාරයට රු 500 000/= ණය මුදලක් සපයා ඇති අතර 10% වාර්ෂික ණය පොලිය වාර්තා කර නොමැත.
- රංග හා තරංගට පිළිවෙලින් රු. 60 000/= ක හා රු. 50 000/= ක ලාභ කොටස් බෙදා ඇත.

36. 2018. 03. 31 න් අවසන් වසර තුල හවුල් ව්‍යාපාරය උපයා ඇති නිවැරදි ශුද්ධ ලාභය වනුයේ,

.............................................................................................................................................

37. ආරම්භක ශේෂයන් නොමැති බවට උපකල්පනය කරමින් 2018. 03. 31 දිනට රංග හා තරංගගේ ජංගම ගිණුම් ශේෂයන්,

රංග - .............................................................................................

තරංග - .............................................................................................

38. LKAS 37ට අනුව ප්‍රතිපාදන හා අසම්භාව්‍ය වගකීම් අතර වෙනස්කම් දෙකක් දක්වන්න.

| | ප්‍රතිපාදන | අසම්භාව්‍ය වගකීම් |
|---|---|---|
| i. | .......................................... | .......................................... |
| ii. | .......................................... | .......................................... |

39. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ට අනුව භාණ්ඩ විකිණීමේ අයභාරය හඳුනා ගැනීමේ දී සම්පූර්ණ කළයුතු කොන්දේසි ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

40. සීමිත යසිරු පොදු සමාගම සාධාරණ අගය රු. 5 000 000 ක් වන යන්ත්‍රයක් 2017. 04. 01 දින සීමිත සුමුදු පොදු සමාගමෙන් කල්බදු ක්‍රමයට මිල දී ගන්නා ලදී. සමාන වාර්ෂික වාරික 5 කින් කල්බදු ණය ගෙවිය යුතු වේ. 2018. 03. 31 දින ගෙවූ පළමු වාරිකය රු.9 600 000/= කි.
(වාරිකය තුල ඇතුලත් පොළිය රු. 160 000/= කි)
දෙවන වර්ෂයේ පොළී වියදම රු. 140, 000/= කි.

ඉහත තොරතුරු වලට අදාලව 2018. 03. 31 දිනට සීමිත යසිරු පොදු සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් කල යුතු වටිනාකම් දක්වන්න.

I. ජංගම නොවන වගකීම් ......................................................
ii. ජංගම වගකීම් ......................................................

41. අ. අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට සමච්ඡේදන ලක්ෂ්‍යය (BEP) ඒකක ප්‍රමාණය ඉහළ යාමට හේතුවන කරුණු දෙකක් ලියන්න.
......................................................
......................................................

ආ. ගබඩාවෙන් ද්‍රව්‍ය නිකුත් කිරීමේ දී ඒවා මිල කිරීමට යොදා ගැනෙන නිර්දේශිත ක්‍රම දෙක මොනවා ද?
......................................................
......................................................

42. 2019 ජනවාරි මාසය සඳහා චන්ද්‍රනී පොදු සමාගමේ වැටුප් ලේඛන සාරාංශය පහත දක්වේ,

| | රු. 000 |
|---|---|
| දළ වැටුප | 6 000 |
| 8% සේවක අර්ථ සාධක අරමුදල | (480) |
| | 5 520 |

සේව්‍යයා විසින් සේවක අර්ථ සාධක අරමුදල සඳහා 12% ක් හා සේවක භාරකාර අරමුදල සඳහා 3% ක් ද දායක වේ. මෙම මස දායක මුදල ඊළඟ මස මුල ප්‍රේෂණය කරනු ලැබේ.

අ. 2019 ජනවාරි මාසය සඳහා අර්ථ සාධක අරමුදල් වියදම වනුයේ,
......................................................

ආ. 2019 ජනවාරි 31 දිනට සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් වගකීම වනුයේ,
......................................................
......................................................

43. පහත සඳහන් ගනුදෙණු හා සිද්ධීන් වලට අදාල ගිණුම් වර්ගය නම් කරන්න.

i. VAT පාලන ගිණුමේ හර ශේෂය ......................................................
ii. ලද අත්තිකාරම් ......................................................
iii. ආපසු ලද වෙළඳ ලැබිය යුතු දෑ මත හානි කරන අලාභ ......................................................
iv. අයිතිකරු ව්‍යාපාරයෙන් සේවා ලබා ගැනීම. ......................................................

44. සීමිත අරවින්ද පොදු සමාගමේ 2018. 03. 31 න් අවසන් වර්ෂයේ විකුණුම් කොමිස් සඳහා සිදු කළ මුදල් ගෙවීම් වල සංයුතිය පහත දැක්වේ,

| | රු. 000 |
|---|---|
| 2016/17 වර්ෂය සඳහා | 50 |
| 2017/18 වර්ෂය සඳහා | 1 900 |
| 2018/ 19 වර්ෂය සඳහා | 10 |

2017. 04. 01 දිනට ඉදිරියට ගෙවූ විකුණුම් කොමිස් රු. 30 000/= ක් වූ අතර 2018. 03. 31 දිනට උපචිත විකුණුම් කොමිස් රු. 20 000 /= ය.
2018. 03. 31 අවසන් වර්ෂය සඳහා විකුණුම් කොමිස් වියදම කොපමණ ද?
......................................................

45. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවල අරමුණ දක්වන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

46. පහත තොරතුරු සීමිත විස්කම් පොදු සමාගමට හා සීමිත දස්කම් පොදු සමාගමට අදාල වේ.

| අනුපාතය | විස්කම් | දස්කම් |
|---|---|---|
| පොළී ආවරණ අනුපාතය | වාර 5 | වාර 10 |
| මුළු වත්කම් වලට ප්‍රතිලාභ අනුපාතය | 35% | 10% |
| ක්ෂණික අනුපාතය | 1 : 1 | 0. 5 : 1 |
| ණය, හිමිකම් අනුපාතය | 2 : 1 | 1 : 2 |
| තොග පිරිවැටුම් අනුපාතය | වාර 6 | වාර 10 |

අ. ද්‍රවශීලතාවය අනුව වඩා හොඳ සමාගම

ආ. වත්කම් කාර්යක්ෂම ලෙස යොදවා ඇති සමාගම


ඇ. අවතෝලනයක් ඇති සමාගම

ඈ. දිගුකාලීන ණය හිමියන්ගේ සුරක්ෂිතතා වැඩි සමාගම

47. පහත ප්‍රස්ථාරයේ සඳහන් A හා B නම් කරන්න.

A ....................................

B ....................................




48. පහත ක්ෂේත්‍රවලට අදාලව කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය ගිණුම්කරණය අතර වෙනසක් දක්වන්න

| ක්ෂේත්‍රය | කළමනාකරණ ගිණුම්කරණය | මූල්‍ය ගිණුම්කරණ |
|---|---|---|
| 1. අවධානය යොමුවන කාලය | ........................................ | ........................................ |
| 2. වාර්තා කිරීමේ වාර ගණන | ........................................ | ........................................ |
| 3. භාවිතා කරන පාර්ශවය | ........................................ | ........................................ |
| 4. පොදුවේ පිළිගත් මූල ධර්ම | ........................................ | ........................................ |

49. විරාජිත්ගේ ව්‍යාපාරයේ පොදු කාර්ය පිරිවැය සම්බන්ධව පහත තොරතුරු ඔබ වෙත සපයා ඇත.

| | නිමැවුම් 1 | නිමැවුම් 2 |
|---|---|---|
| ඇස්තමේන්තුගත පොදු කාර්ය පිරිවැය | 180 000 | 120 000 |
| ඇස්තමේන්තුගත නිෂ්පාදන ශ්‍රම පිරිවැය | 6 000 | 4 000 |
| නිෂ්පාදන ඒකකයකට අවශ්‍ය ශ්‍රම පැය | 5 | 1. 5 |

පොදු කාර්ය පිරිවැය ශ්‍රම පිරිවැය මත අන්තර්ග්‍රහණය කරයි.

නිමැවුම් දෙපාර්තමේන්තු සඳහා අන්තර්ග්‍රහණය කළ යුතු පොදු කාර්ය පිරිවැය වෙන් වෙන්ම දක්වන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

50. පිළිගෙවුම් කාලයට සාපේක්ෂව ශුද්ධ වර්තමාන අගයට ආයෝජන ඇගයීමේ වාසි දෙකක් සඳහන් කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................